## 2.9 ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ලබ්ධිකයන්ගේ කාලීක සහ අවකාශීය ව්‍යාප්තිය

ඩබ්. වරුණිකා නිශානි ප්‍රනාන්දු
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

මිනිස් චින්තනය, ඉතිහාසය හා ශිෂ්ටාචාරය ප්‍රබල පරිවර්තනයකට ලක් කිරීමේ ලා අපූර්ව ශක්‍යතාවයකින් යුතු ප්‍රපංචයක් ලෙස "ආගම්" සැලකිය හැක. ආගම යන්න භූගෝලීය වශයෙන් සලකන කල කාලය සහ අවකාශය ඔස්සේ විහිදෙන සංකීර්ණ ක්‍රියාවලියක් ලෙස හඳුනාගත හැක. ලෝකය තුළ පවතින සෑම ආගමක්ම ව්‍යාප්තව ඇත්තේ මෙම කාලය හා අවකාශය නැමති න්‍යාය පදනම් කර ගනිමිනි. (Max Weber 1904-1905) මානුෂ භූගෝල විද්‍යාවේදී මානසික ප්‍රත්‍යක්ෂයක් (Menti Facts) ලෙස ආගම අධ්‍යයනයට භාජනය කරනු ලබයි.

වර්තමාන ශ්‍රී ලංකාව තුළ ද මානව චර්යා, සමාජ ආර්ථික රටා, දේශපාලන ව්‍යුහය විග්‍රහ කිරීමේ දී ආගම ප්‍රබල වශයෙන් විවාදයට තුඩු දෙන සංවේදී මාතෘකාවක් බවට පත් වී තිබේ. ශ්‍රී ලංකාවේ පවත්නා ආගම් අතරින් වඩා විවේචනාත්මක විචාරයට ලක්වන ක්‍රිස්තියානි ධර්මයේ කාලීක සහ අවකාශීය ව්‍යාප්තිය තුලනාත්මකව විග්‍රහ කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. 16 වන සියවසේ යටත්විජිතකරණයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස පැමිණි ක්‍රිස්තියානි ධර්මය අදහන්නන්ගේ ප්‍රමාණය, ශ්‍රී ලාංකීය මුළු ජනගහනයෙන් 6.9% ක් නියෝජනය කරන බව 2001 සංගණන වාර්තාව සනාථ කරයි. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ධර්මයේ ව්‍යාප්තිය හඳුනාගැනීම, ආගම ව්‍යාප්තිය සඳහා බලපා ඇති සාධක විග්‍රහ කිරීම මෙන්ම කාලීක හා අවකාශීය වශයෙන් පවතින රටාවන් හඳුනා ගැනීම තුලින් යම් න්‍යායාත්මක රාමුවක් ගොඩ නැගීමට උත්සාහ දැරීම ද අරමුණු වේ.

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ද්විතීක දත්ත මත පදනම් වූ අතර ප්‍රාථමික දත්ත සඳහා අධ්‍යයනයට සෘජුවම සම්බන්ධ වන කතෝලික දේවස්ථාන, රදගුරු මැදුර, දේවධර්ම ශාස්ත්‍රාලය වැනි ආයතන හා දැනුම සහිත පුද්ගලයන් තොරතුරු දායකයන් ලෙස භාවිතා කරනු ලැබිණි.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාව තුළ ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත වීමේ කාලීක සහ අවකාශීය රටාවක් පැහැදිලිවම හඳුනාගත හැකි වූ අතර, එම ව්‍යාප්ති රටාව කෙරෙහි බලපාන ලද සුවිශේෂී සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ක්‍රියාවලීන් පැවති බවද අනාවරණය විය. ශ්‍රී ලංකාවේ කිතුදහම මූලික වශයෙන් රෝමානු කතෝලික සහ රෝමානු කතෝලික නොවන ලෙස දෙකොටසකට බෙදී පවතින අතර රෝමානු කතෝලික නොවන ආගම් අතර සාධාර්මික සභාව(Orthodox) සහ රෙපරමාදු සභාව මූලික වේ. වර්තමානය වන විට එම සභාවන් විවිධ අභිප්‍රායන් මුල් කර ගනිමින් වෙනත් කුඩා නව නිකායන් රාශියකට බෙදී පවතී. එවැනි නිකායන් හි ක්‍රියාකාරීත්වය පිළිබඳ වත්මන් සමාජය තුළ ද ගැටළු රාශියක් උද්ගත වී ඇත. මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ධර්මයේ ව්‍යාප්තිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ භූගෝල විද්‍යාත්මක අර්තකථනයක් දීමට හැකිවනු ඇත.

කාලීක හා අවකාශීය ව්‍යාප්තිය, මානසික ප්‍රත්‍යක්ෂය